# ආරක්ෂක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ගුවන් හමුදාව

## මිල ගණන් කැඳවීමයි (IFB)

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නැවුම් සහ වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම සහ බෙදාහැරීම සඳහා ප්‍රසම්පාදනය - 2026 වර්ෂය

### කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය : SLAF/RA/TB/2026

1. 2026 වසර සඳහා ත්‍රිවිධ හමුදාව වෙත නැවුම් සහ වියළි ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය වෙනුවෙන් පත් කරන ලද ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SHLPC) සභාපති විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව (SLAF) වෙනුවෙන්, සුදුසුකම් ලත් සහ ශ්‍රී ලංකාවේ සීමිත සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ආයතනයක් ලෙස ස්ථාපිත නිෂ්පාදන, තොග හා සිල්ලර මෙහෙයුම්කරුවන්ගෙන් පහත සඳහන් ආහාර කාණ්ඩයන් ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු / පහිනාංක වෙත සැපයීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. සැපයුම් කාලය **2026 ජනවාරි 1** දින සිට **2026 දෙසැම්බර් 31** දින දක්වා වර්ෂයක කාලයක් සඳහා වේ.

**1.1 සැපයුම් ස්ථාන සමූහය සහ අනුරූපී කාණ්ඩයන්**

**1.1.1** A **කාණ්ඩය - නැවුම් ආහාර අයිතම**

| ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨ/ මූලික කඳවුරු/ කඳවුරු/ පහිනාංක | | ආහාර අයිතම කාණ්ඩ |
|---|---|---|
| 1.1.1.1. අම්පාර<br>1.1.1.2. අනුරාධපුර<br>1.1.1.3. මඩකලපුව<br>1.1.1.4. B.I.A. කටුනායක<br>1.1.1.5. චීන වරාය<br>1.1.1.6. කොළඹ<br>1.1.1.7. C.T.S. දියතලාව<br>1.1.1.8. දිගන<br>1.1.1.9. T.T.S. ඒකල<br>1.1.1.10. හිඟුරක්ගොඩ<br>1.1.1.11. ඉරණමඩු<br>1.1.1.12. කටුකුරුන්ද<br>1.1.1.13. කටුනායක | 1.1.1.14. කොග්ගල<br>1.1.1.15. මත්තල<br>1.1.1.16. මොරවැව<br>1.1.1.17. මීරිගම<br>1.1.1.18. පලාලි<br>1.1.1.19. පාලවි - පුත්තලම<br>1.1.1.20. පිදුරුතලාගල<br>1.1.1.21. රත්මලාන<br>1.1.1.22. සීගිරිය<br>1.1.1.23. වව්නියාව<br>1.1.1.24. වීරවිල | 1. එළවළු, පළතුරු, පොල් සහ කිකිළි බිත්තර<br>2. අලුත් මාළු<br>3. මස් වර්ග<br>4. කුකුල් මස් (ශුද්ධ කළ)<br>5. බේකරි නිෂ්පාදන<br>6. දේශීය උදෑසන ආහාර ද්‍රව්‍ය |

**1.1.2** B **කාණ්ඩය - වියළි ආහාර අයිතම**

| ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨ/ මූලික කඳවුරු/ කඳවුරු/ පහිනාංක | | ආහාර අයිතම කාණ්ඩ |
|---|---|---|
| 1.1.2.1. අම්පාර<br>1.1.2.2. අනුරාධපුර<br>1.1.2.3. මඩකලපුව<br>1.1.2.4. B.I.A. කටුනායක<br>1.1.2.5. චීන වරාය<br>1.1.2.6. කොළඹ<br>1.1.2.7. C.T.S. දියතලාව<br>1.1.2.8. දිගන<br>1.1.2.9. T.T.S. ඒකල<br>1.1.2.10. හිඟුරක්ගොඩ<br>1.1.2.11. ඉරණමඩු<br>1.1.2.12. කටුකුරුන්ද<br>1.1.2.13. කටුනායක | 1.1.2.14. කොග්ගල<br>1.1.2.15. මත්තල<br>1.1.2.16. මොරවැව<br>1.1.2.17. මීරිගම<br>1.1.2.18. පලාලි<br>1.1.2.19. පාලවි - පුත්තලම<br>1.1.2.20. පිදුරුතලාගල<br>1.1.2.21. රත්මලාන<br>1.1.2.22. සීගිරිය<br>1.1.2.23. වව්නියාව<br>1.1.2.24. වීරවිල | 1. සහල්<br>2. වියළි සලාක<br>3. යෝගට්<br>4. කිරි පිටි<br>5. කුළුබඩු (ආහාරමය)<br>6. තේ කොළ |

1.2 ලංසු ලේඛනය තුළ එක් එක් ආහාර ද්‍රව්‍ය කාණ්ඩ වල පිරිවිතරයන් සහ විස්තර සපයනු ලැබේ. සපයනු ලබන සියලු ආහාර ද්‍රව්‍ය මානව පරිභෝජනය සඳහා සුදුසු තත්ත්වයේ තිබිය යුතුය. තත්ත්ව ප්‍රමිතීන් ලංසු ලේඛනයේ සහ ලංසු ලේඛනවල අදාළ ඇමුණුම් තුළ නිශ්චිතව දක්වා ඇති අතර ඒ අනුව සියලුම සැපයුම් 1980 අංක 26 දරන ආහාර පනත, එයට සිදු කරන ලද සංශෝධන සහ වරින්වර බලාත්මක කරන ලද රෙගුලාසි වලට අනුකූල විය යුතු ය.

1.3 **ගුවන් හමුදාවේ විද්‍යාපීඨ / මූලික කඳවුරු/ කඳවුරු/ පහිනාංක පදනමෙන් ආහාර කාණ්ඩ යටතේ ලංසු ඉදිරිපත් කිරීම.**

1.3.1 එක් එක් විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු/ පහිනාංක තුළ එක් එක් කාණ්ඩය සඳහා වෙන් වෙන් වශයෙන් ලංසු ඉදිරිපත් කළ යුතුය. නිශ්චිත එක් එක් විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු/ පහිනාංක, දී ඇති ඕනෑම කාණ්ඩයක් සඳහා එම කාණ්ඩය යටතේ ලැයිස්තුගත කර ඇති සියලුම අයිතම සඳහා ලංසුකරුවෙකු ලංසු ඉදිරිපත් කිරීමට අසමත් වුවහොත් එය ප්‍රතිචාරාත්මක නොවන ලංසුවක් ලෙස සලකනු ලැබේ.

1.3.2 ගැනුම්කරු විසින් තක්සේරු කරනු ලබන ලංසුකරුවන්ගේ ධාරිතාව මත පදනම්ව, ඕනෑම ලංසුකරුවෙකුට එක් කඳවුරකට හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයකට අදාළ ලංසු ඉදිරිපත් කළ හැක.පහත විස්තර කර ඇති පරිදි ලංසු කාණ්ඩ දෙකකට බෙදා ඇත.

**1.3.2.1** A **කාණ්ඩය - නැවුම් ආහාර අයිතම සැපයීම**

මෙම කාණ්ඩය ලංසු 119 කින් සමන්විත වන අතර (සැපයුම් ස්ථාන 24 x 4) + (සැපයුම් ස්ථාන 19 x 1) + (සැපයුම් ස්ථාන 4 x 1) ලෙස සෑම ලංසුවක්ම වෙන වෙනම ප්‍රසම්පාදනයක් ලෙස සලකා ඇගයීමේ හා තේරීමේ ක්‍රියාවලිය ඇගයීම් සහ තේරීම් ක්‍රියාවලිය ඒ ඒ අය සඳහා ස්වාධීනව සිදු කෙරේ.

**1.3.2.2** B **කාණ්ඩය - වියළි ආහාර අයිතම සැපයීම**

මෙම කාණ්ඩය ලංසු 123 කින් සමන්විත වන අතර (සැපයුම් ස්ථාන 24 x 5) + (සැපයුම් ස්ථාන 3 x 1) = 123, වෙන වෙනම ප්‍රසම්පාදනය ලෙස සලකා ඇගයීමේ හා තේරීමේ ක්‍රියාවලිය ක්‍රියාවලිය ඒ ඒ අය සඳහා ස්වාධීනව සිදු කෙරේ.

2. තෝරාගනු ලබන සැපයුම්කරුවන් විසින් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව එක් එක් විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු/ පහිනාංක වෙත ආහාර ප්‍රවාහනය සම්බන්ධයෙන් වගකිව යුතුය. එක් එක් විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු/ පහිනාංක පිළිබඳව විස්තර ලංසු ලේඛණයෙහි ඇතුලත් කර ඇත.

3. සැපයුම්කරුවන් තෝරා පත්කර ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 හි ඡේද 3.1.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය (NCB) යටතේ සිදු කරනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ හැක්කේ දේශීය ලංසුකරුවන් හට පමණි.

4. ලංසුකරු අසාධු ලේඛණගත ලංසු කරුවෙකු නොවිය යුතුය.

5. අදාල සුදුසුකම් සනාථ කිරීම කළ හැකි ලේඛණයන් ද ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවේ දී එම සුදුසුකම් ලංසු ලේඛනවල දක්වා ඇති විස්තරාත්මක ක්‍රමවේදය යටතේ ප්‍රමාණාත්මක ඇගයීමකට භාජනය කර එක් එක් අවම ලංසු ඉදිරිපත් කර ඇගයීමට ලක් වූ ලංසුකරුවන් වෙත පිරිනමන උපරිම කොන්ත්‍රාත්තු ප්‍රමාණය තීරණය කරනු ලැබේ .

5.1 ආසන්නම මූල්‍ය වර්ෂ 03 ඇතුලත මූල්‍ය වර්ෂ 02 ක ආහාර සැපයීම් කිරීමේ ක්ෂේත්‍රයෙහි අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම **රුපියල් මිලියන 10** ක් හෝ **රු. මිලියන 5**, ලංසු ලේඛනයේ වර්ගීකරණය කර, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයක් මගින් සනාථ කල යුතුය.

5.2 අවම වශයෙන් **රුපියල් මිලියන 05 ක** හෝ **රු. මිලියන 03ක්,** ද්‍රවශීල වත්කමක් (අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, කෙටිකාලීන ආයෝජන සහ ලැබිය යුතු කෙටිකාලීන ණය) ඇති බව (2023/ 2024 විගණය කරල ලද මූල්‍ය ප්‍රකාශණ මත පදනම්ව) ඊට අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කළ යුතුය.

කෙසේ වෙතත් ලංසුකරුවා ලංසු සමග විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් නොකරන්නේ නම්, 2024/2025 මූල්‍ය වර්ෂය සඳහා වන ලංසු සමඟ විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන ලංසු විවෘත කරන දිනයේ ඉදිරිපත් කළ යුතුය.

5.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත දැනට ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් හෝ මූල්‍ය ආයතන විසින් (මෙම ටෙන්ඩරය සඳහාම) සපයනු ලබන අවම ණය පහසුකම් සීමාව **රුපියල් මිලියන 05 ක්** හෝ **රුපියල් මිලියන 02 ක්** විය යුතුයි.

5.4 අමු ආහාර අයිතමයන් සැපයීම සදහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම්, ශීත කාමර/ අධි ශීතකරණ සහ ශීත ට්‍රක් රථ පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. (එම පහසුකම්හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට ලබා ගෙන තිබිය හැක). ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛණය සමග ලබාදෙනු ලැබේ.

5.5 වියළි ආහාර අයිතමයන් සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, හෝ ප්‍රවාහන පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සදහන් කළ යුතුය. (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට ලබා ගෙන තිබිය හැක). අමතර විස්තර ලංසු ලේඛනයන් තුළ සපයා ඇත.

5.6 ඕනෑම ආයතනයකට (රාජ්‍ය /පෞද්ගලික) ආහාර ද්‍රව්‍ය (තොග / සිල්ලර ව්‍යාපාර) සැපයීමට අදාළ ආසන්නත ම පසුගිය වසර 05 ක් තුල වර්ෂ 02 ක් සඳහා ආහාර සැපයීම පිළිබඳ අත්දැකීම් තිබිය යුතුය.

5.7 ලංසුකරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි විය යුතුය.

6. ලංසු ලේඛණ නිකුත් කිරීම, ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීමට අදාල දිනය සහ වේලාව පහත පරිදි වේ.

**ලංසු ලේඛන නිකුත් කිරීම සහ ඉදිරිපත් කිරීමේ දිනය සහ වේලාව**

| | | |
|---|---|---|
| ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ කරනු ලබන දිනය | - | **2025.06.23** |
| ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව | - | **2025.07.14 ප.ව. 3.00 දක්වා** |
| ලංසු ඉදිරිපත් කල යුතු අවසාන දිනය සහ වේලාව | - | **2025.07.15 පෙ.ව. 9.00 දක්වා** |
| ලංසු විවෘත කරන ස්ථානය, දිනය සහ වේලාව | - | ගුවන් හමුදා මූලස්ථානය,<br>තැ.පෙ. 594,<br>ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,<br>ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.<br>**2025.07.15 පෙ.ව. 09.30 ට** |

7. පූර්ව ලංසු රැස්වීම **2025.06.26** වන දින **පෙ.ව. 11.00 ට පළමු මහල, නන්දිමිත්‍ර ශ්‍රවනාගාරයේදී, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,** ලිපිනයෙහි පැවැත්වේ.

8. පහත ඡේද 16 හි සඳහන් ලිපිනයෙන් ලංසුකරුගේ ලිඛිත ඉල්ලීම පරිදි ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී මගින් ලංසුකරුවන් හට නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ලංසු ලේඛනයන් මිලදී ගත හැක. එක් එක් ස්ථානය/කඳවුර/එක් එක් ලංසු සඳහා අදාළ ආපසු නොගෙවන ගාස්තුව 2024 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 6.2 වගන්තියට අනුකූල විය යුතුය. (එක් එක් ලංසුවට අදාලව ආපසු නොගෙවනු ලබන වටිනාකම් පිළිබඳ විස්තර පහත ඡේද 15 හි සඳහන් ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී යන ලිපිනයෙන් ලබා ගත හැක).

9. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන් ලංසු ලේඛනයේ දී ඇති ආකෘති පත්‍ර පමණක් භාවිතා කළ යුතු ය. ඉහත 6 වන ඡේදයේ දක්වා ඇති දිනය සහ වේලාවට පෙර මුද්‍රා තබන ලද **ලංසු පිටපත් දෙකකින්** යුතුව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් අදාළ ලංසු තැන්පත් කිරීමට තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතු ය.

10. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 6 වන ඡේදයේ දක්වා ඇති ලිපිනයෙහි ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කෙරේ.

11. ඉදිරිපත් කරන ලංසුවෙහි වලංගු කාලය **2026.03.31** දක්වා වලංගු විය යුතු ය.

12. **2026.04.30** දක්වා වලංගු **ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්** වෙත යොමු කරන ලද ලංසු සුරක්ෂණයක් සහිතව ලංසු ඉදිරිපත් කළ යුතු ය. එම ලංසු සුරක්ෂණ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද (අදාල බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂණයෙහි මුල් පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණයෙහි වටිනාකම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 ප්‍රකාරව ලංසු ලේඛනයෙහි සඳහන් කර ඇත.

13. ගැනුම්කරුවන් විසින් අවශ්‍ය යැයි දක්වා ඇති පරිදි නිෂ්පාදන අවසර සහතිකය අවශ්‍ය නම්. එය පශ්චාත් සුදුසුකම් අවශ්‍යතාවයක් විය හැක.

14. ලංසුකරුවන් විසින් ලංසු ලේඛනයෙහි අමතර තොරතුරු ඉල්ලා ඇති නිශ්චිත අයිතම සඳහා නියැදි අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු ය. **නියමිත කාල සීමාව තුල නියැදියන් ලබා නොදෙන ලංසුකරුවන්ගේ ලංසු ඉදිරියට ලංසු සැලකිල්ලට නොගන්නා අතර, එම ලංසුව ප්‍රතිචාර නොදැක්වූ ලංසුවක් වශයෙන් සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

15. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට අවශ්‍ය අතිරේක විස්තර වෙතොත් ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, ප්‍රසම්පාදන අංශයේ මාණ්ඩලික නිලධාරී ප්‍රසම්පාදන (ටෙන්ඩර්) හෝ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී මගින් ලබාගත හැකි අතර, ඊට අදාල ලංසු ලිපි ලේඛණ පහත ඡේද අංක 16 දක්වා ඇති ලිපිනයේදී කිසිදු ගාස්තු ගෙවීමකින් තොරව **2025.06.23** වන දින සිට **2025.07.14** වන දින දක්වා සතියේ වැඩකරන දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** අතර කාලය තුළ පරීක්ෂා කළ හැකිය.

16. ඉහත සඳහන් කළ ලිපිනය වන්නේ

| | | |
|---|---|---|
| **අවධානය** | : | ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී |
| **ලිපිනය** | : | ශ්‍රී ලංකා ගුවන් හමුදාපති<br>ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය<br>තැ.පෙ. 594<br>ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය<br>ශ්‍රී ජයවර්ධනපුර<br>කෝට්ටේ |
| **දුරකථන අංකය** | : | +9411 - 2347694, +9411- 2441044 (ext : 11902) |
| **ෆැක්ස් අංකය** | : | +9411- 2441553 |
| **ඊ මේල්** | : | cpd@slaf.gov.lk, acpot@slaf.gov.lk |

**සභාපති**

**ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව**

**2026 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාවට ආහාර අයිතම (නැවුම් සහ වියළි) ආහාර ප්‍රසම්පාදනය**

**ආරක්ෂක අමාත්‍යාංශය**

**2025/06/20**

SELACINE MEDIA SOLUTIONS